# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 47 දරන
# අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 ඔක්තෝබර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1992 ඔක්තෝබර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 47 දරන අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 ඔක්තෝබර් මස 21 වන දින.]

එල්. ඩී.—ඕ. 1/92

**අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය," යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව සංගමයේ පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: **පූර්විකාව.**

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 47 දරන අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) 'අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියළු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. **අම්බලන්ගොඩ දේශප්‍රේමී සංවිධානය සංස්ථාගත කිරීම.**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

(අ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභ සාධන, සංස්කෘතික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ නිරත වීම;

(ආ) මාර්ග සංවර්ධනය සහ නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, ආරෝග්‍යශාලා, අධ්‍යාපන මධ්‍යස්ථාන, පාසල් සහ ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සහ වෙනත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම භාර ගැනීම;

2 — ඩී 020968 —5,680 (91/12)

(ඇ) දිළිඳු දරුවන්ට ඇඳුම් පැළඳුම් සැපයීමෙන්, ඉගැන්වීම සඳහා ගාස්තු ගෙවීමෙන් හෝ එවැනි වෙනත් මාර්ග සැලසීමෙන්, ඔවුන්ට යම් වෘත්තියකට රක්ෂාවකට හෝ සේවයකට සුදානම් වීමේ, ඇතුළත් වීමේ හෝ නිරතවීමේ අවස්ථා සැලසීම ;

(ඈ) අධ්‍යාපනය සහ දැනීම වැඩිදියුණු කිරීම, ව්‍යාප්ත කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, පාසල් පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒවා පවත්වාගෙන යාම ඇතුළුව ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මූල්‍යාධාර සහ වෙනත් ආකාරයෙන් වූ ආධාර ප්‍රදානය කිරීම, දීම සහ සැලසීම ;

(ඉ) යම් කර්මාන්තයක හෝ වෘත්තියක නැතහොත් යම් අපනයනය හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම, කෘෂි කාර්මික, කාර්මික සහ වාණිජ ව්‍යාපාර ආරම්භ කොට පවත්වාගෙන යාමට තැනැත්තන්ට ආධාර දීම සහ හෝ සහාය වීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ යම් විදේශීය හෝ දේශීය වෙනයම් ආයතනයක් හෝ සංවිධානයක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම හෝ ඒකාබද්ධ වීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේදී හෝ වෙනත් යම් රටකදී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත්කිරීම සහ බෙදාහැරීම ;

(එ) සංස්ථාවේ සුභසිද්ධිය සඳහා ශ්‍රී ලංකාවේදී හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරදී තැනැත්තන් පුහුණු කිරීම ; සහ

(ඒ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය වන, ආනුෂංගික වන හෝ හිතකර වන යම් ක්‍රියාවන්, කර්තව්‍ය සහ දේ ඉටුකිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත බැංකු ගිණුම් විවෘත කිරීමේ පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේද, සම්මාදම් මුදල්, ආධාර මුදල් හෝ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේද ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් අස් කිරීමේද බලය ඇතුළුව

සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍යවන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් ඉටු කිරීමේ, සිදු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන කළමනාකරණ කමිටුවක් විසින් සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය :—

(අ) ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් මිස යාවජීව වශයෙන් සංස්ථාවේ සභාපති ධුරය දැරිය යුතු දළුවත්ත හේවා බුද්ධික සරත් කුරුකුලරත්න මහතා ;

(ආ) උප සභාපතිවරුන් දෙදෙනෙකු ; ප්‍රධාන ලේකම්වරයකු, උප ලේකම්වරයකු සහ භාණ්ඩාගාරිකවරයකු සහ සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන වෙනත් සාමාජිකයන් හතර දෙනෙකු.

(2) සංස්ථාවේ පළමුවන කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ සංගමයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුලු කර ගැනීම, නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සඳහාද කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සඳහාද කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන්ද සංස්ථාවේ සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම්වලදී කටයුතු කිරීමේදී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාවේ මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ලැබූ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේය. එවැනි රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සෑම සාමාජිකයෙක්ම සියලු විටම සංස්ථාවේ තත් කාලයේ වලංගුව බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

(3) සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා හෝ මින් මතු සම්මත කරගනු ලබන රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දය කින් මිස, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකරනු ලැබිය යුතු ය :

එසේ වුවද එවැනි යම් වෙනස් කිරීමක් එකතු කිරීමක් සංශෝධනය කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක් කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද්දේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංගමයේ බල පැවැත් වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

7. (1) සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම පිළිබඳ නිසි ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් විගණනය කළ යුතු ය.

(3) මේ වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එවැනි ආයතනයක පාලක සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇත්තා වූ ද පුද්ගලයෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ව්‍යාපාරික ආයතනයක එක් එක් වාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් තමා සතුව ඇත්තා වූ ද ගණකාධිකාරී ව්‍යාපාරයක්

අදහස් වේ.

දේපළ අත් කර ගැනීමට සහ මුදල් ලබා ගැනීමට ඇති බලය.

8. (1) යම් මිලට ගැනීමක්, තෑග්ගක්, රිත්ථවරණය කිරීමක්, ප්‍රදානයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, නියාදනය කිරීමක්, හුවමාරු කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් යම් දේපළක් අත්කර ගැනීමට සහ කවර චංචල හෝ නිශ්චල දේපළක් දැරීමට සහ සංස්ථාව සතුව ඇති හෝ සංස්ථාව විසින් දරනු ලබන එවැනි යම් දේපළක් නියාදනය කිරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මුදල් යම් ඇපයක් මත ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ බලය සහ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් ඉටු කිරීම සඳහා සුදුසුයයි සලකනු ලබන ආකාරයෙන් ඇප තැබීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

(3) සංස්ථාව විසින් අරමුදල් ලබා ගනු ලැබිය හැකි අතර දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ වෙනත් ආකාරයකින් සම්මාදම් මුදල්, ප්‍රදාන, පරිත්‍යාග සහ ත්‍යාග භාරගනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ සංස්ථාව විසින් අත්කරගනු ලැබූ හෝ දරනු ලබන චංචල සහ නිශ්චල සියලු දේපළ සහ සංස්ථාව වෙත ගෙවනු ලැබූ හෝ සංස්ථාව වෙත ලැබුණු සියලු මුදල් සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාව විසින් දැරිය යුතු ද පාවිච්චි කරනු ලැබිය යුතු ද හෝ යොදවනු ලැබිය යුතු ද වේ.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපතිගේ භාරයෙහි තිබිය යුතු අතර, එය සභාපති සහ සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව තත් කාර්ය සඳහා බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතුය. ඒ දෙදෙන තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

10. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගත්තා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්ථවරණ පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකාර කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ආදායම සහ දේපළ යෙදිය යුතු ආකාරය.

11. කවර ආකාරයකින් හෝ ලැබුණා වූ සංස්ථාවේ මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි හුදෙක්ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා අදාළ කරනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක් ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක ආකාරයෙන් ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු ණය සංස්ථාවට ගෙවිය යුතු බව.

12. (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දින යෙහි සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

(2) සංගමය විසින් ඇති කර ගත්තා ලද ගිවිසුම් සංස්ථාවේ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**13.** සාමාජිකයෙකුගෙන් අය විය යුතු වාර්ෂික දායක මුදල ඉක්මවූ කිසිදු මුදල් ප්‍රමාණයක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු යටත් නොවන්නේය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම සංගමය හෝ සංගම් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 355, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.